# අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) පාඨමාලාව 2015/2016

# (සිංහල මාධ්‍යය)

## 1.0 හැඳින්වීම :

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය මගින් පවත්වනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව ගුරු අධ්‍යාපන පාඨමාලාවක් වශයෙන් විශාල කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රථම උපාධියෙන් පසුව ගුරු පත්වීම් ලබන උපාධිධාරීන්ට පාසල් හා පන්ති කළමනාකරණය පිළිබඳවත්, ඉගැන්වීම පිළිබඳවත්, න්‍යායික වූත් ප්‍රායෝගික වූත් පුහුණුවක් ලබා දීම සඳහා යොමු වූ විවිධ පාඨමාලා අතරින් කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය මගින් පවත්වනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සති අන්ත පාඨමාලාවක් වශයෙන් ද වසර 20 ක කාලයක් තුළ පවත්වා ඇත.

## 2.0 පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ අරමුණු :

2.1 ඉගැන්වීම හා කළමනාකරණය සම්බන්ධයෙන් පුහුණුවක් ලබා නොමැති උපාධිධාරී ගුරුවරුන් හා අනෙකුත් වෘත්තීය පුද්ගලයින් පුහුණු කිරීම.

2.2 පාඨමාලාව හදාරන පිරිස් තුළ ගුරු වෘත්තිය හා පාසල සම්බන්ධයෙන් ප්‍රතිජනනාත්මක ආකල්ප වර්ධනය කිරීම.

2.3 අධ්‍යාපන විද්‍යාව සම්බන්ධයෙන් සැකසුණු උසස් පාඨමාලා හැදෑරීම පිණිස තවදුරටත් යොමු කිරීම.

2.4 අධ්‍යාපනයේ සංවර්ධනය සඳහා අවශ්‍ය අධ්‍යාපන පර්යේෂණ සඳහා පුහුණු කිරීම.

2.5 සමකාලීන අධ්‍යාපනික ගැටලු හා ප්‍රවණතා සම්බන්ධයෙන් දැනුම යාවත්කාලීන කිරීම හා නිපුණතා වර්ධනය තුළින් අධ්‍යාපනික ගැටලු විසඳීමේ සක්‍රීය සහභාගීත්වය සඳහා යොමු කිරීම.

2.6 නුපුහුණු උපාධිධාරීන් පුහුණු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය දරන ප්‍රයත්නයට ක්‍රියාකාරී වශයෙන් සහයෝගය දීම.

## 3.0 විෂයමාලාව

පහත සඳහන් ආකාරයට 3.1 සිට 3.9 දක්වා ඇති විෂය ක්ෂේත්‍ර නවයක් යටතේ පාඨමාලාව සංවිධානය වී ඇත.

3.1 සිට 3.7 දක්වා විෂය දේශන මගින් ඉගැන් වේ.

ඉන් 3.1 සිට 3.5 දක්වා විෂයන් ඉගැන්වෙන්නේ පැය 3 බැගින් වූ සැසි 16 බැගින් යොදා ගනිමිනි. අනෙක් විෂය කාර්ය සැසි පදනම් කර සංවිධානය කෙරේ.

| ***විෂයය*** | ***විෂය හඳුන්වන කේතය*** |
|---|---|
| 3.1 අධ්‍යාපන මූලධර්ම හා ගැටලු | (PPE) |
| 3.2 තුලනාත්මක අධ්‍යාපනය | (CPE) |
| 3.3 අධ්‍යාපන මනෝවිද්‍යාව | (PSY) |
| 3.4 අධ්‍යාපනික මිනුම් හා ඇගයුම් | (EME) |
| 3.5 අධ්‍යාපනික පරිපාලනය | (EAD) හෝ |
| විෂයමාලාව හා පාසල් සංවිධානය | (CSO) |
| 3.6 ඉගැන්වීමේ ක්‍රමවිද්‍යාව-සාමාන්‍ය ක්‍රම | (GEM) |
| සහ | |
| විශේෂිත ක්‍රම (විෂය 1) | (STM) |
| විශේෂිත ක්‍රම (විෂය 2) | (STM) |
| 3.7 විශේෂ අධ්‍යයන ක්ෂේත්‍ර (දෙකක් හැදෑරිය යුතුය) | (SAE) |